දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ප්‍රථම භාග 2022 පුනර් පරීක්ෂණය

2022 නොවැම්බර් / දෙසැම්බර්

ආ.වි.ස. 2.1 - සූක්ෂම ආර්ථික න්‍යාය

කාලය පැය තුනයි (03)

ඕනෑම ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ගණක යන්ත්‍ර භාවිතයට අවසර ඇත.

---

01.

I. උපේක්ෂා වක්‍ර සිතියමක ප්‍රධාන ගුණාංග විස්තර කරන්න.

(ලකුණු 05 )

II. උපේක්ෂා වක්‍ර විග්‍රහයේ දී මිල වෙනස් වීමක ආදේශන ප්‍රතිවිපාකය හා ආදායම් ප්‍රතිවිපාකය වෙන් කර හඳුනාගැනීම සඳහා පහත සඳහන් ක්‍රම යොදාගත හැකි ආකාරය අවශ්‍ය රූපසටහන් යොදාගනිමින් පැහැදිලි කරන්න.

a) ආදායමේ වන්දි විචලන ක්‍රමය
b) ආදායමේ සමාන විචලන ක්‍රමය
c) පිරිවැය වෙනස ක්‍රමය

(ලකුණු 12)

III. උපේක්ෂා වක්‍ර විග්‍රහයේ දී පාරිභෝගික අතිරික්තය මිනුම් කරන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 03 )

02.

I. උපේක්ෂා වක්‍ර විග්‍රහය ඇසුරින් බාල භාණ්ඩ හා ගිෆන් භාණ්ඩ වෙන් කොට හඳුනාගත හැකි ආකාරය අවශ්‍ය රූපසටහන් යොදාගනිමින් විස්තර කරන්න.

(ලකුණු 10)

II. පුද්ගලයින් දෙදෙනකු පමණක් සිටින සහ භාණ්ඩ වර්ග දෙකක් පමණක් නිෂ්පාදනය කරන ආර්ථිකයක් උදාහරණයට ගනිමින්, “ස්වයංපෝෂිත ආර්ථිකයකයකට වඩා හුවමාරු ආර්ථිකයක සමාජ සුභසාධන මට්ටම ඉහළ අගයක් ගනී.” යන ප්‍රකාශනය උපේක්ෂා වක්‍ර උපයෝගි කර ගනිමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

03.

I. නිෂ්පාදන ශ්‍රිතයක් යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 03)

II. කෙටිකාලින නිෂ්පාදන ශ්‍රිතයක් හා දිගුකාලින නිෂ්පාදන ශ්‍රිතයක් අතර පවතින වෙනස්කම පැහැදිලි කරන්න.

(ලකුණු 04)

III. සම නිෂ්පාදන වක්‍ර සිතියමක් යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 03)

IV. එකකට එක බැගින් සම නිෂ්පාදන වක්‍ර සිතියම් භාවිත කරමින් පහත සඳහන් සංකල්ප පැහැදිලි කරන්න.

a) ප්‍රශස්ත සාධක සංයෝගය
b) ප්‍රසාරණ මාර්ගය
c) ස්ථාවර පරිමානානුකූල ඵල
d) වැඩෙන පරිමානානුකූල ඵල
e) හීනවන පරිමානානුකූල ඵල

(ලකුණු 10 )

04.

I. පූර්ණ තරගකාරි ආයතනයක ඉල්ලුම් වක්‍රය හා ඒකාධිකාරි ආයතනයක ඉල්ලුම් වක්‍රය එක හා සමාන නොවේ. එම ආයතනයන්හි ඉල්ලුම් වක්‍රයන්හි ස්වරූපය හා ඊට අදාළවන හේතු ඉදිරිපත් කරමින් ඉහත ප්‍රකාශය සනාථ කරන්න.

(ලකුණු 05 )

II. "පූර්ණ තරගකාරි ආයතනයක් කෙටි කාලයේ දී අලාභ ලැබුවත් තවදුරටත් නිෂ්පාදනයේ නිරතවිය හැකි ය." ඔබ ඉහත ප්‍රකාශය සමඟ එකඟ වන්නේ ද ? හේතු ඉදිරිපත් කරමින් සනාථ කරන්න.

(ලකුණු 05 )

III. පූර්ණ තරගකාරි ආයතනයකට දිගු කාලයේ දී ප්‍රාමාණික ලාභ පමණක් ලබා ගත හැකි ය. ඔබ ඉහත ප්‍රකාශය සමඟ එකඟ වන්නේ ද ? යන්න හේතු ඉදිරිපත් කරමින් සනාථ කරන්න.

(ලකුණු 05 )

IV. නිෂ්පාදකයෙකුට යම් නිෂ්පාදනයක එක් ඒකකයක් රුපියල් 110/= කට අලෙවි කළ හැකි ය. මුළු පිරිවැය තුළ ඇතුළත් ස්ථාවර පිරිවැය රු 7,500/= ක් සහ එක් ඒකකයකට විචල්‍ය පිරිවැය රුපියල් 60/= වේ.

a) සමප්‍රතිභේදන ලක්ෂ්‍යය කරා ළඟාවීම සඳහා ඒකක කීයක් නිෂ්පාදනය කළ යුතු ද?

b) නිෂ්පාදකයාට රුපියල් 1250/= ක ලාභයක් ලබා ගැනීම සඳහා ඒකක කීයක් අලෙවි කළ යුතු ද?

c) ඒකක 100 ක් අලෙවි කළ හොත් නිෂ්පාදකයාගේ ලාභය හෝ අලාභය කොපමණ වේද?

(ලකුණු 05 )

05

I. ඒකාධිකාරියෙකුගේ ඉල්ලුම් ශ්‍රිතය සහ මුළු පිරිවැය ශ්‍රිතය පිළිවෙලින්

$P = 200 - \frac{1}{5}Q$ සහ $TC = Q^2 + 128Q$ වේ.

නිෂ්පාදනය කරන සෑම ඒකකයක් සඳහා ම රජය " t " බද්දක් පනවයි.

a) බදු ආදායම උපරිම කරන ඒකක බද්ද (t) ගණනය කරන්න.

(ලකුණු 04)

b) මුළු බදු ආදායම ඇස්තමේන්තු කරන්න.

(ලකුණු 04)

c) බද්දට පෙර නිමවුමට වඩා බද්දට පසු නිමවුම අඩු බවත්, බද්දට පෙර මිලට වඩා බද්දට පසු මිල වැඩි බවත් පෙන්වන්න.

(ලකුණු 04)

II. X භාණ්ඩය නිපදවන සමාගමක් ක්‍රියාත්මක වන්නේ පූර්ණ තරගකාරී වෙළෙඳපොළක ය. සමාගමේ කෙටි කාලීන මුළු පිරිවැය වන්නේ

$TC = \frac{Q^2}{4} + 3Q + 400.$ වේ.

$\frac{d}{dQ}AC = 0,$ වන විට,

ආන්තික පිරිවැය සහ සාමාන්‍ය පිරිවැය සමාන බව පෙන්වන්න.

(ලකුණු 08)

06.

I. ඒකාධිකාරී ආයතනයක් වෙළෙඳපොළවල් දෙකක විවිධ මිල ගණන් අය කර භාණ්ඩයක් විකිණීමේ දී, එනම් මිල විශේෂණය කිරීමේ දී.

A වෙළෙඳපොළේ දී ඉල්ලුම් ශ්‍රිතය වන්නේ

$P_A = 100 - Q_A$ වන අතර

B වෙළෙඳපොළේ ඉල්ලුම් ශ්‍රිතය

$P_B = 84 - Q_B$, වේ.

මෙහි $Q_A$ සහ $Q_B$ යනු A සහ B වෙළෙඳපොළේ දී සතියකට අලෙවි කරන ප්‍රමාණයන් වන අතර, $P_A$ සහ $P_B$ එම භාණ්ඩ ඒකකයක අදාළ මිල වේ.

ඒකාධිකාරීයාගේගේ මුළු පිරිවැය ශ්‍රිතය

$TC = 600 + 4Q.$

මෙහි $Q = Q_A + Q_B.$

a) ලාභය උපරිම කිරීම සඳහා එක් එක් වෙළෙඳපොළේ කොපමණ ප්‍රමාණ අලෙවි කළ යුතු ද? (ලකුණු 08)

b) මෙම උපරිම ලාභය ලබා දෙන විකුණුම් මිලයන් කවරේ ද? (ලකුණු 04)

c) මිල විශේෂණය නොමැතිව ලාභය උපරිම කිරීම සඳහා ඒකාධිකාරයා කුමන මිලක් අය කළ යුතු ද? (ලකුණු 04)

d) මිල විශේෂණය කරන හා මිල විශේෂණය නොකරන අවස්ථාවල ලාභ අතර වෙනස සංසන්දනය කරන්න.

(ලකුණු 04)

07.

I. භාණ්ඩ වෙළෙඳපොළ හා සාධක වෙළෙඳපොළ පූර්ණ තරගකාරි අවස්ථාවක දී සාධක සේවා නියුක්තිය හා එහි මිල තීරණය වන ආකාරය අවශ්‍ය රූප සටහන් භාවිත කරමින් පැහැදිලි කරන්න.

(ලකුණු 07)

II. භාණ්ඩ වෙළෙඳපොළ ඒකාධිකාරයේ හා සාධක වෙළෙඳපොළ පූර්ණ තරගකාරි අවස්ථාවක දී සාධක සේවා නියුක්තිය හා එහි මිල තීරණය වන ආකාරය අවශ්‍ය රූප සටහන් භාවිත කරමින් පැහැදිලි කරන්න.

(ලකුණු 07 )

III. සාධක වෙළෙඳපොළ තුළ ඒකාධිකාරි සූරා කෑමක් ඇතිවනුයේ සාධක වෙළෙඳපොළ අපූර්ණ තරගයේ පැවතීම නිසා නොව භාණ්ඩ වෙළෙඳපොළ ඒකාධිකාරි වීම නිසාවෙනි. මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු පැහැදිලි කරන්න.

(ලකුණු 06 )

08. පහත සඳහන් සංකල්ප අතුරින් හතරක් (04) විස්තර කරන්න.

I. නිෂ්පාදනයේ අදියර තුන
II. ආර්ථික බද්ධකුලිය
III. ආන්තර බද්ධකුලිය
IV. උපේක්ෂා වක්‍ර විග්‍රහයේ කෝණිය විසඳුම්
V. ස්විසිගේ නැමුණු ඉල්ලුම් වක්‍රය
VI. වැටි රේඛා

(ලකුණු 5*4 = 20 )

-------------------------------@@@@@@@@-----------------------------